**මහ කොළඹ නාගරික ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය - III අදියර - 2018**

**-----------------------------------------------------------------------------------**

මහ කොළඹ නාගරික ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතියේ III අදියරේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ චීන ආනයන හා අපනයන බැංකුව සමඟ 2014 සැප්තැම්බර් 16 දින ඇතුලත් වූ අංක පිබීසී (2014) 15 එකතු අංක (309) දරන ණය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය වර්තමානයේ මාර්ග සහ මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වන්නේ, කොළඹ ප්‍රධාන නගරයේ ප්‍රවාහන තදබදය අඩු කිරීමට හා රටේ අනිකුත් ප්‍රදේශවලට සම්බන්ධතාවය වැඩිදියුණු කිරීම සඳහා දක්ෂිණ අධිවේගී මාර්ගය සහ කොළඹ නගරයෙන් පිටතට යන අනෙකුත් ජාතික මාර්ගවලට සම්බන්ධ කෙරෙන කොළඹ නගරයෙන් බැහැර අධිවේගී මාර්ගයක් ඉදිකිරීම තුලින් ශ්‍රී ලංකාවේ පලාත් අතර ආර්ථික සංවර්ධනය ශක්තිමත් කිරීමට දායක වීමය. ණය ගිවිසුමට අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 76,200 කට සමාන එ.ජ.ඩො මිලියන 590 ක් වූ අතර ඉන් රු.මිලියන 63,356 කට සමාන එ.ජ.ඩො. මිලියන 494 ක් මූල්‍යායනය කිරීමට චීන ආනයන හා අපනයන බැංකුව එකඟවී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2014 අගෝස්තු ආරම්භ කර තිබුණු අතර 2019 ජුනි වන විට අවසන් කිරීමට අපේක්ෂිත විය.

## 1.3 මතය

ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. භෞතික කාර්යසාධනය

### 2.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය

අනාරාධිත ලංසු කැඳවීම් පදනම මත තෝරාගත් විදේශ සමාගමකට පිටත වටරවුම මහාමාර්ගයේ අදියර III යටතේ කඩවත සිට කෙරවලපිටිය දක්වා කිලෝමීටර 9.63 ක් මහාමාර්ගය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව රු. මිලියන 66,696 ක පිරිවැයකට 2013 පෙබරවාරි 21 පිරිනමා තිබුණි. පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන ගැටළුව | බලපෑම | කළමණාකරනයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
| --- | --- | --- | --- |
| 2014 අගෝස්තු මස කොන්ත්‍රාත්කරු කාර්යයේ යෙදී තිබුණද විෂය පථයේ පසුව සිදුකරන ලද වෙනස්කම් හේතුවෙන් අදාල ඉදිකිරීම් කටයුතු 2016 ජනවාරි 01 දින ආරම්භ කර තිබුණි. තවද මහාමාර්ගයේ ඉදිකිරීම් කටයුතු 2019 ජුනි 13 වන දින නිම කිරීමට අපේක්ෂා කර තිබුණු අතර භෞතික කටයුතුවල මන්දගාමී ප්‍රගතිය සහ යම් ස්ථානවල වැඩබිම් භාරදීමේ ප්‍රමාදයන් හේතුවෙන් කොන්ත්‍රාත්තුවේ කාලය 2019 දෙසැම්බර් 10 දක්වා දීර්ඝකර තිබුණි. අපේක්ෂිත ප්‍රගතිය සියයට 92.81 ට එරෙහිව 2018 දෙසැම්බර් 31 දිනට මහාමාර්ග ඉදිකිරීමේ කටයුතුවල සමස්ථ ප්‍රගතිය සියයට 84.14 ක්ව පැවතුණි. | ව්‍යාපෘතියේ පිරිවැය ඉහල යෑමට ඉඩ ඇත. | කොන්ත්‍රාත්කරුට වැඩබිම භාරදීමේ ප්‍රමාදයන් හේතුවෙන් ව්‍යාපෘතියේ කාලය 2019 දෙසැම්බර් 10 දින දක්වා දීර්ඝ කර ඇත. | අමතර පිරිවැය අවම කරගැනීමට උත්සාහ කිරීමට පියවර ගතයුතුය. |

## 2.2 කොන්ත්‍රාත් පරිපාලනය

| | විගණන ගැටළුව | බලපෑම | කළමණාකරනයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
| --- | --- | --- | --- | --- |
| (අ) | උපදේශක සේවා සඳහා කොන්ත්‍රාත් ගිවිසුමේ 6.5(අ) කොන්දේසියේ 3 වගන්තිය අනුව උපදේශකට ගෙවන ලද එ.ජ.ඩො. 474,579.60 හා රු. මිලියන 96.36 ක අත්තිකාරම් මුදල සමාන මාසික වාර 30 කින් අයකර ගැනීම අවශ්‍යවන අතර 2017 මැයි 31 දින වන විට නිමකිරීමට අවශ්‍යවේ. කෙසේවෙතත් 2018 දෙසැම්බර් 31 දිනට එ.ජ.ඩො. 458,123.12 හා රු. මිලියන 93.01 ක් පමණක් අයකරගෙන තිබුණි. | කොන්ත්‍රාත් කාලය අවසානයේදී අත්තිකාම් මුදලේ ශේෂය අයකර නොගෙන පැවතීමට ඉඩ ඇත. | නිසි පරිදි අදහස් දක්වා නැත. | කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසි සමඟ අනුගතවීම අවශ්‍යවේ. |
| (ආ) | 2014 සැප්තැම්බර් 16 දින ණය ගිවිසුම අත්සන් කර තිබුණද ණය මුදලේ ආරම්භක වියපැහැදම 2015 දෙසැම්බර් 31 දින සිදුකර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘතිය විසින් රු. මිලියන 91.63 ක බැඳීම් ගාස්තු මුදලක් වැය කර | ණය මුදල් ප්‍රතිපාදන අපේක්ෂිත අරමුණු සඳහා උපයෝජනය නොවේ. | අදහස් දක්වා නොමැත | ව්‍යාපෘතියේ මූල්‍ය සැලැස්ම සමඟ අනුගත වීම අවශ්‍යවේ. |

| | | | | |
|---|---|---|---|---|
| | තිබුණි. තවද කොන්ත්‍රාත්කරුවන් විසින් කරන ලද හිමිකම් පෑම් නිරවුල් කිරීමේ ප්‍රමාදයන් හේතුවෙන් 2018 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය විසින් රු.මිලියන 86 ක පොලී මුදලක් දරා තිබුණි. | | | |
| (ඇ) | මුල් ප්‍රමාණ පත්වල ඇතුලත් වූ රු. මිලියන 10,775 ක ඇස්තමේන්තුගත පිරිවැයකට කෙරවලපිටිය අන්තර් හුවමාරුව ඉදිකිරීම සහ අභ්‍යන්තර මන්තීරු 04 ක් ඉදිකිරීමේ කටයුතු පසුව අවලංගුකර තිබුණු අතර ඉවත් කරන ලද කටයුතුවල පිරිවැය හිලව්වන පරිදි කඩවත ආරම්භක ස්ථානයේ අන්තර් හුවමාරුව ඉදිකිරීම සහ කුළුණුමතින් ඉදිවෙන මාර්ග ඉදිකිරීමේ නව කටයුතු හඳුන්වාදී තිබුණු බව නිරීක්ෂණය විය. තවද ප්‍රමාණපත්වලට අනුව රු. මිලියන 2,967.12 ක ඇස්තමේන්තුගත පිරිවැයකට සිදුකල යුතු මූලික කටයුතු, බිම් කටයුතු සහ වෙනත් සිවිල් ඉදිකිරීම් කටයුතු යටතේ අයිතම් 133 ක කටයුතු කොන්ත්‍රාත්කරු විසින් ක්‍රියාත්මක කර නොතිබුණි. | දුර්වල කොන්ත්‍රාත් පරිපාලනය සහ ඉදිකිරීම් සැලසුම් කිරීමකි. | ප්‍රමාණපත්වල සියලු අයිතමයන් වෙත යොමුවීම අත්‍යාවශ්‍ය නොවේ. තවද සමහර අවශ්‍ය අයිතමයන් වෙත යොමුවීම සඳහා කොන්ත්‍රාත්කරුගේ ප්‍රමාදයන් ඇත. | විස්තරාත්මක සැලසුම් පිළියෙළ කරන අවස්ථාවේදී ආදාල විෂය පථයට සිදුකරන වෙනස්කම් අවම කර ගතයුතුය. |
| (ඈ) | කඩුවෙල ප්‍රදේශයේ අදාල අන්තර් හුවමාරුව ඉදිකිරීමට වැඩ විෂය පථය වෙනස්කිරීමේ ප්‍රතිඵලයක් ලෙස මහාමාර්ගය සඳහා වූ අන්තර් හුවමාරුවක් ඉදිකිරීම වෙනුවෙන් 2017 සහ 2018 වර්ෂවලදී රු. මිලියන 22.31 ක පිරිවැයකට මතුමගල ප්‍රදේශයේ අත්කර ගන්නා ලද හෙක්ටයාර් 27.02 ක ඉඩම නිශ්කාර්යව පැවතුනි. | පිටස්තර පාර්ශවයන් විසින් ඉඩම් බලහත්කාරයෙන් අල්ලා ගැනීමට ඉඩ ඇත. | ඒ 3 මාර්ගයෙන් මීටර 900 ක් නුදුරින් වෙනත් අන්තර් හුවමාරුවක් කෙරවලපිටිය පවතින නිසා ඒ 3 මාර්ගයට ඇතුල්වීමක් සහ පිටවීමක් ඉදිකිරීමේ අදහස ඉවත් කර ගෙන තිබුණි. කෙසේවෙතත් ඒ 3 මාර්ගයට යාබදව අත්කර ගන්නා ලද ඉඩම අනාගතයේදී ඵලදායී කටයුත්තකට යෙදවීමට අපේක්ෂා කෙරේ. | ඉඩමේ ආරක්ෂාව පිළිබඳව සහතික වීමට අවශ්‍ය පියවර ගත යුතු අතර ප්‍රමාදයකින් තොරව භාවිතයට ගතයුතුය. |
| (ඉ) | නිවාස හානි, පාංශු ඛාදනයන් සහ නිවාස තුලට මඩ ගැලීම්, ඇල මාර්ග හැරවීමේ හේතුවෙන් වගා අහිමි වීම සහ ඉඩම් සඳහා නිසි | කාලීනව සමාජ ගැටලුවලට අවධානය යොමු කිරීමේ ප්‍රමාදයන් | ලිඛිත පැමිණිලි 600 ක් ලැබී තිබුණු අතර ඉන් පැමිණිලි 331 ක් ඉතිරිව පවතී. සියළුම පැමිණිලි | කොන්ත්‍රාත්තුව සහ රක්ෂණාවරණය අවසන් වීමට පෙර හානි වූ දේපල සකස්කිරීම |

| | | | |
|---|---|---|---|
| ප්‍රවේශ මාර්ග නොමැතිවීම යනාදි හේතුන් නිසා පීඩාවට පත් පාර්ශවයන්ගෙන් පැමිණිලි 401 ක් ලැබී තිබුණු බව නිරීක්ෂණය විය. කෙසේවෙතත් ලැබී තිබුණු මුලු පැමිණිලි වලින් 2019 සැප්තැම්බර් 31 දිනට කොන්ත්‍රාත්කරු විසින් පැමිණිලි 269 ක් පමණක් විසඳා තිබුණි. | හේතුවෙන් වන්දි මත පිරිවැය ඉහල යෑමට ඉඩ ඇත. | නිරාකරණය වන තුරු ක්‍රියාවලිය ක්‍රියාත්මක වේ. | පිළිබඳ ගැටලු විසඳීමට අවධානය යොමු කළ යුතුය. |

**2.3** **ඉඩම් අත්පත්කර ගැනීම සහ නැවත පදිංචිකිරීම පිළිබඳ ගැටලු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන ගැටළුව | බලපෑම | කළමණාකරනයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | ලැබී තිබුණු තොරතුරු අනුව මාර්ග ඉදිකිරීමේ අරමුණු සඳහා ව්‍යාපෘතිය මගින් වත්තල සහ මහර ප්‍රාදේශිය ලේකම් කාර්යාල යටතේ පවතින රජයේ ඉඩම් කොටස් 296 ක් ඇතුලුව ඉඩම් කොටස් 1,561ක් අත්පත් කරගෙන තිබුණු අතර 2018 දෙසැම්බර් 31 දිනට ඒ සඳහා රු. මිලියන 5,794.14 ක වන්දි මුදලක් ගෙවා තිබුණි. තවද වන්දි මුදල් නිරාකරණය කිරීමේ ප්‍රමාදයන් හේතුවෙන් 2018 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය මගින් රු. මිලියන 1,094 ක පොලී මුදලක් ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය. කෙසේවෙතත් ඉඩම් කොටස් 292 ක පමණක් අයිතිය මාර්ග සංවර්ධන අධිකාරිය වෙත පවරා ඇත. | ශ්‍රී ලංකා රජයට අමතර පිරිවැයක් වේ. | කාලීනව ගෙවීම් කිරීමට අග්‍රිම මුදල් හිඟකම හේතුවෙන් 38(අ) වගන්තිය ගැසට්කළ දින සිට ගෙවීම් කරන දින දක්වා ව්‍යවස්ථාපිත තක්සේරු සඳහා පොලී ගෙවීමට සිදුවේ. කොටස් 292 ක් පමණක් සඳහා 44 වගන්තිය ප්‍රසිද්ධ කර ඇති අතර ක්‍රියාවලිය සිදුවෙමින් පවතී. | ඉලක්කගත දිනයට සම්පූර්ණ කිරීමට ඉඩම් අත්පත්කර ගැනීමේ කටයුතු නිසි පරිදි සැලසුම් කළ යුතුය. |
| (ආ) | රු. මිලියන 34 පිරිවැයකට නැවත පදිංචි කිරීමේ අරමුණින් වත්තල ප්‍රාදේශිය ලේකම් කාර්යාලය ප්‍රදේශයේ පවතින හෙක්ටයාර් 2.63 ක මිල්ගහවත්ත යන ඉඩමක් අත්පත්කර ගෙන තිබුණු අතර තවද එකතුව රු. මිලියන 48.37 ක් සංවර්ධන කටයුතු | පදිංචි වී නොමැති ඉඩම් කොටස් බලහත්කාරයෙන් අල්ලා ගැනීමට ඉඩ ඇත. | වත්තල ප්‍රදේශයේ පීඩාවට පත් මහජනතාවට ඉතිරි ඉඩම් කොටස් බෙදාදෙනු ලැබේ. | පීඩාවට පත් ජනතාව පදිංචි වනතුරු ඉතිරි ඉඩම් කොටස් ආරක්ෂා කර ගැනීමට පියවර ගතයුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | සඳහා වැයකර තිබුණි. ව්‍යාපෘතිය පවුල් 57 ක් නැවත පදිංචි කිරීමට අපේක්ෂා කර තිබුණද 2018 දෙසැම්බර් 31 දිනට පවුල් 34 ක් පමණක් නැවත පදිංචිකර තිබුණි. | | | |
| (ඇ) | වර්ෂ 2014 දී රු. මිලියන 96.19 ක පිරිවැයකට මිලදී ගත් හෙක්ටෙයාර් 2.43 කින් යුත් ජයසුමනවත්ත ඉඩමේ නැවත පදිංචි කල පවුල් 07 කින් වෙනුවට පවුල් 36 කින් ඉඩම් කොටස්වල පිරිවැය අයකර ගැනීමට ව්‍යාපෘතිය පියවර ගෙන නොතිබුණි. | අපේක්ෂිත අරමුණු ලඟාකර ගැනීමට නොහැකිවේ. | ජයසුමනවත්ත නැවත පදිංචි කිරීමේ ඉඩම පියවර 02 කට බෙදා ඇත. පියවර 1 යටතේ ඉඩම් කොටස් 36 තිබෙන අතර පුද්ගලයින් 08 දෙනකුට පමණක් ගෙවීම් කර තිබුණි. පියවර II යටතේ මුළු ඉඩම් කොටස් 58 කෙරවලපිටිය පවුල් සඳහා ලබාදී තිබුණු අතර 2018 දෙසැම්බර් 31 දින තෙක් නිරාකරණය කර නොතිබුණි. | ව්‍යාපෘතිය අවසාන අවස්ථාවේදී ඉතිරි ඉඩම් කොටස්වල අයිතිය මාර්ග සංවර්ධන අධිකාරිය වෙත පැවරීම අවශ්‍ය වේ. |